පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

11 වන සතිය

ශ්‍රේණිය - 11

සැකසුම - කලාප අධ්‍යාපන කාර්යාලය කෑගල්ල

* සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

නම :.......................................

ඒ. මාර්ක් ශිල්පියාගේ නිර්මාණ අගයමු

ඒ. මාර්ක් (1933 - 2000)

- 20 වන සියවස අගභාගයට අයත් දමිළ ජාතික ශිල්පියෙකි.
- 1933 වසරේදී යාපනයේ ගුරුනගර් හි උපත ලබා ඇත.
- චිත්‍ර කලාවට මෙන්ම මූර්ති කලාවට ද ප්‍රවීණයෙකි.
- රජයේ ලලිත කලා ආයතනයට ඇතුළත්ව චිත්‍ර කලාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලැබූවෙකි.
- විඩුමුරෙයික් කල්වි ඕවියක් කලහම් නම් විවේක කාලවල චිත්‍ර කලාව හැදෑරීමේ එකමුතුව නම් සංගමයක් ඔහු පිහිටුවා ඇත.

- ඔහුගේ චිත්‍ර නිර්මාණවල ලක්ෂණ අනුව යුග 2 කි
  - (1) වර්ණ පදනම් කරගත් යුගය
  - (2) රේඛා පදනම් කරගත් යුගය

- වර්ණ පදනම් කරගත් යුගය
  - අඳුරු යුගය
  - සුදු යුගය
  - නිල් යුගය

  ලෙස හඳුනාගත හැකි ය.

- රේඛා පදනම් කරගත් යුගය ඝනිකවාදී යුගය වශයෙන් හඳුන්වා ඇත.

- පැස්ටල් වර්ණ, දියසායම්, කොලාජ්, මිශ්‍ර මාධ්‍ය ආදිය භාවිතා කරමින් සාමාන්‍ය කඩදාසි මත මෙම නිර්මාණ සිදු කර ඇත.

ඔහු විසින් නිර්මාණය කරන ලද විශිෂ්ට චිත්‍ර නිර්මාණ කිහිපයක් පහත දැක්වේ.

- සකුන්තලා
- තාණ්ඩවම්
- කාවඩි නැටුම
- රාගමාලිගෙයි

සකුන්තලා චිත්‍රය

- කාලිදාස විසින් රචිත සකුන්තලා කාව්‍යයේ ප්‍රධාන චරිතය වන සකුන්තලා මෙහි වස්තු විෂය වී ඇත
- පැස්ටල් මාධ්‍ය ශිල්පීය ක්‍රමය
- ඝනිකවාදී ශෛලීය
- හෙන්රි මුවර් ශිල්පියාගේ මූර්ති ආභාසය

- ස්වභාවිකත්වය අභිබවා ව්‍යූක්තකරණ කලා ලක්ෂණ පෙන්වයි.
- ඝනික හැඩතල හා ළා පැහැති පැතලි වර්ණ නිසා ද්විමාන කලා ලක්ෂණ වලින් යුක්ත වුවද රූපය වටා යොදා ඇති ඝන රේඛාකරණය නිසා ත්‍රිමාන ලක්ෂණ මතු කර පෙන්වයි.
- පසුබිම් වර්ණය තලය පුරා විහිදෙන සේ වර්ණ ගන්වා ඇත.
- සමස්ත වර්ණ, හැඩතල හා රේඛාකරණයෙන් සකුන්තලාගේ අභ්‍යන්තර භාවමය හැඟීම් ප්‍රකාශ කිරීමට උත්සාහ දරා ඇත.

මිනිසා සහ බල්ලන් මූර්තිය

- ඉවතලන ද්‍රව්‍ය (found objects) උපයෝගී කර ගනිමින් නිර්මාණය කර ඇත
- මේ සඳහා ප්ලාස්ටික් බෝතල, ප්ලාස්ටික් තල භාවිත කර ඇත
- ඒ. මාර්ක්ගේ සුවිශේෂී නිර්මාණයක් වන මෙහි ඔහුට ආවේණික නව්‍ය මූර්ති ශිල්ප ක්‍රමයක් දැක්වේ

- ඉදිරිපස ගාත් ඔසවා සිටගත් බල්ලන් දෙදෙනෙක බල්ලන්ගේ රූපවලට වඩා කුඩා මිනිසෙකු දැක්වේ
- ඝනිකවාදි කලා ලක්ෂණ සහ හෙන්රි මුවර්ගේ මූර්ති නිර්මාණවල ලක්ෂණ ආභාස වී ඇත
- ප්ලාස්ටික් බෝතල් වල දිගටි හා විවර සහිත හැඩ, රිද්මයානුකූලව හා සමබරව අවකාශය සමග භාවිතා කර ඉදිරියට හා ඇතුළට නෙරා ගිය කොටස් මතු කරමින් මෙය නිර්මාණය කර ඇත.
- විස්තරාත්මක බවින් අඩු සරල ප්‍රකාශනය මෙහි ඇති සුවිශේෂීතාවයයි

ඒ මාර්ක් ශිල්පියගේ නිර්මාණ	සකුන්තලා චිත්‍රය	මිනිසා සහ බල්ලන් මූර්තිය
තේමාව		
ආභාසය		
ශිල්ප ක්‍රමය		
කලා ලක්ෂණ – රූප/හැඩතල භාවිතය අවකාශය/ තලය භාවිතය භාව/හැඟීම් ප්‍රකාශනය		